# ACCOUNTING EQUATION (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## ආදායම්

ව්‍යාපාරයක් සිය මෙහෙයුම් කටයුතුවලින් ආදායම් උපදවනු ලබයි.

ගිණුම් කාලච්ඡේදයේ දී ව්‍යාපාරයට මුදල් ගලා ඒම හෝ වත්කම් වැඩි කිරීමේ හෝ වගකීම් අඩු කිරීමේ ස්වභාවයෙන්, අයිතිකරුවන්ගේ දායකත්වයෙන් තොරව හිමිකම ඉහළ නැංවීමට හේතු වන ආර්ථික ප්‍රතිලාභයන්ගේ ඉහළ යාම "ආදායම්" ලෙස හැඳින්වේ.

## වියදම්

ව්‍යාපාරයක් මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී විවිධ වර්ගයේ ැයද් දරන අතර ගිණුම් කාලච්ඡේදයක් තුළ දී ව්‍යාපාරයෙන් පිටතට මුදල් ගලායාම් හෝ වත්කම්වල අගය අඩුවීම් හෝ වගකීම් වැඩිවීමේ ස්වභාවයෙන් අයිතිකරුවන්ට කරන බෙදාහැරීම් හැර, හිමිකම් අඩුවීමට හේතු වන ආර්ථික ප්‍රතිලාභයන්ගේ අඩුවීම "වියදම්" ලෙස අර්ථ දැක්වේ.

## මෙහෙයුම් ප්‍රතිඵලය

කාලච්ඡේදයේ ආදායම හා වියදම අතර වෙනස මෙහෙයුම් ප්‍රතිඵලයයි.

## ලාභය සහා අලාභය

වියදම ඉක්මවා ඇති ආදායම **ලාභය** වන අතර, ආදායම ඉක්මවා යන වියදම් **අලාභය** වේ.

Classwork.LK

## ගැනිලි

ව්‍යාපරයේ අයිතිකරු සිය පුද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපරයෙන් ලබා ගන්නා භාණ්ඩ, මුදල් හෝ දේපළ පාවිච්චි කිරීම **ගැනිලි** ලෙස හඳුන්වන අතර, ගැනිලි සිදු කිරීම නිසා හිමිකම් අඩු වේ.

## ලාභය හෝ අලාභය ගණනය කිරීම

ව්‍යාපාරයේ ආරම්භක හිමිකම හා අවසාන හිමිකම අතර වෙනසට ගැනිලි එකතු කිරීමෙන් හා අමතර යෙදූ ප්‍රාග්ධනය අඩු කිරීමෙන් ලාභය හෝ අලාභය ගණනය කළ හැකිය.

P/L= CAN – ONA + D - AC

| | රු |
|---|---|
| අවසාන ශුද්ධ වත්කම් (CAN) / අවසාන හිමිකම් | x x x |
| - ආරම්භක ශුද්ධ වත්කම් (OAN) / ආරම්භක හිමිකම් | (x x) |
| | x x |
| + ගැනිලි (D) | x x |
| - අමතර ප්‍රාග්ධනය (AC) | (x x) |
| ලාභය / අලාභය (P/L) | x x/(x x) |

ClassWork.LK

# උදාහරණ – 01

## රූපිකාගේ ව්‍යාපාරය

| ගනුදෙනුව සිදුවූ දිනය | ප්‍රාග්ධනය | ආදායම් | වියදම් | වගකීම් | වත්කම් |
|---|---|---|---|---|---|
| 01/01 | + 1300 | | | | ගොඩනැගිලි + 800<br>මුදල් + 500 |
| 01/02 | | | | | මුදල් - 225<br>ද්‍රව්‍ය තොග + 225 |
| 01/03 | | + 150<br>විකුණුම් | + 100<br>(විකුණුම් පිරිවැය) | | මුදල් + 150<br>ද්‍රව්‍ය තොග - 100 |
| 01/04 | | | | + 200<br>බැංකු ණය | මුදල් + 200 |
| 01/05 | | | + 3<br>(දුරකථන)<br>+ 2<br>(විදුලිය) | | මුදල් - 5 |
| 01/06 | | | + 10<br>(වැටුප) | | මුදල් - 10 |
| 01/07 | - 4<br>ගැනිලි | | + 10<br>(වැටුප) | | මුදල් - 4 |
| 01/07 | | + 50<br>(විකුණුම්) | + 40<br>(විකුණුම් පිරිවැය) | | ද්‍රව්‍ය තොග - 40<br>ණයගැති + 50 |
| | **1296** | **200** | **155** | **200** | **= 1541** |

(රු. 000)

එක් එක් ගනුදෙනුව මගින් ප්‍රාග්ධනයට, අදායමට,වියදමට වත්කම්වලට හා වගකීම්වලට අති කරන බලපෑම + හා - මගින් දැක්වේ.

කාලච්ඡේදයේ ලාභය පහත ආකාරයට ගණනය කළ හැකි ය.

ලාභය = ආදායම - වියදම

**45 = 200 - 155**

ClassWork.LK

රූපිකාගේ ව්‍යාපරයේ ලාභය / අලාභය ශුද්ධ වත්කම් ඇසුරෙන් පහත ආකාරයට ගණනය කළ හැකි ය..

| | රු |
|---|---|
| අවසාන ශුද්ධ වත්කම් | 1 341 |
| - ආරම්භක ශුද්ධ වත්කම් | (1 300) |
| | 41 |
| + ගැනිලි | 04 |
| ලාභය | **45** |

ClassWork.LK

## අභ්‍යාස

01. ව්‍යාපාරික හිමිකම වෙනස්වීමට බලපාන ගනුදෙනු ඇතුලත් පිළිතුර තෝරන්න.

A - අයිතිකරු සතු රු. 400 000 ක ඉඩම් හා ගොඩනැගිලි ව්‍යාපාර කටයුතු සඳහා යෙදීම.

B - අයිතිකරුගේ නිවසේ දුරකතන බිල රු. 50 000 ක් ව්‍යාපාර මුදලින් ගෙවීම.

C – ව්‍යාපරයේ විදුලිය ගාස්තු රු. 150 000 ක් ගෙවීම.

D – ව්‍යාපරයේ ප්‍රයෝජනය පිණිස රු. 100 000 ක් ගෙවා පරිගණකයක් මිලට ගැනීම.

E – ව්‍යාපාරයේ ස්ථාවර තැන්පතුවක් සඳහා පොලිය වශයෙන්

රු. 20 000 ක් ලැබීම.

**(I) ABDE (II) ABCD (III) ABCE (IV) BCDE (V) ABC**

ClassWork.LK

**02**. පහත සඳහන් ප්‍රකාශවල හිස්තැනට ගැලපෙන වචනය පහත දී ඇති යෙදුම් අතරින් තෝරා ලියන්න.

(යෙදුම් : ගැනිලි, වියදම්, ආදායම්, හිමිකම, අමතර ප්‍රාග්ධනය)

(i) පවත්වා ගෙන යන ව්‍යාපරයකට අතිරේක ව අයිතිකරුවන් යොදවන සම්පත් ........................................ ලෙස හැඳින්වේ. මෙමගින් හිමිකම වැඩි කරයි.

(ii) ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමේ දී විවිධ වූ ........................................ දැරීමට සිදු වේ. මෙමගින් හිමිකම අඩු වේ.

(iii) ව්‍යාපරයේ අයිතිකරු ව්‍යාපාරයෙන් ඉවත් කර ගන්නා සම්පත්වල මූල්‍ය වටිනාකම ........................................ ලෙස හැඳින්වේ. මෙවැනි ගනුදෙනු නිසා හිමිකම අඩු වේ.

(iv) ව්‍යාපාරයේ විවිධ මෙහෙයුම් කටයුතු/ක්‍රියාකරකම් නිසා විවිධ ඉපයීම් ලැබේ. මේවා ........................................ ලෙස හැඳින්වේ. මෙවැනි ගනුදෙනු නිසා හිමිකම වැඩි වේ.

(v) ව්‍යාපරයේ අයිතිකරුවන්ට ව්‍යාපාරය සම්බන්ධව ඇති අයිතිය ........................................ ලෙස හැඳින්වේ.

ClassWork.LK

**03**. පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණද වැරදි නම් (x) ලකුණ ද යෙදීම.

(i) ආදායම් මගින් ව්‍යාපාර හිමිකම වැඩි වේ.

.........................

(ii) අමතර ප්‍රාග්ධනය යෙදීමෙන් හිමිකම වෙනස් නොවේ.

.........................

(iii) ආදායම් ඉපයීමේ දී විවිධ වියදම් දැරීමට සිදු වේ.

.........................

(iv) බැංකු ණයක් ගැනීමෙන් හිමිකම පමණක් වැඩි වේ.

.........................

(v) ගැනිලි සිදු කිරීම නිසා ව්‍යාපාරයේ වියදම් වැඩි වේ.

.........................

ClassWork.LK

04. රජිතගේ ව්‍යාපාරයේ 2017/01/01 දිනට පැවති වත්කම් හා වගකීම් පහත දැක්වේ. (රු. 000 වලින්)

ඉඩම් ගොඩනැගිලි රු. 5 000, මෝටර් රථ රු. 3 000, ස්ථාවර තැන්පතුව රු 2 000, බඩු තොගය රු 1 000, මුදල් ශේෂය රු, 1 500, බැංකු ණය රු 2 000

2017 ජනවාරි මාසය තුළ සිදු වූ ගනුදෙනුවල සාරාංශය පහත දැක්වේ. (රු. 000 වලින්)

1. පිරිවැය 400 ක බඩු තොග රු. 600 ක අත්පිට මුදලට විකිණීම.

2. සේවක වේතන ගෙව්වා රු, 100 යි.

3. රු. 500 ක බඩු තොග රසිකාගෙන් ණයට ගැනීම.

4. රු. 200 ක තොග රු. 300 ට ඉමාෂාට ණයට විකිණීම.

5. රජිති නිවසේ පැවති දානමය කටයුත්තකට රු. 50 ක බඩු තොගයක් ව්‍යාපරයෙන් රැගෙන යෑම.

6. ජනවාරි මාසයට අදාළ ව ලැබුණු විදුලි බිල රු. 20

7. බැංකු ණය සඳහා පොළී ගෙව්වා රු, 20 යි.

අවශ්‍ය වන්නේ :

1. වත්කම් - හිමිකම් + වගකීම් යන සමීකරණයට ඉහත ගනුදෙනු මගින් සිදුවන බලපෑම +/- වශයෙන් (වටිනාකම සමග) ලිවීම.

2. වත්කම් - හිමිකම් + වගකීම් යන සමීකරණයට ඉහත ගනුදෙනු මගින් සිදුවන බලපෑම +/- වශයෙන් (වටිනාකම සමග) ලිවීම.

3. ඉහත දැක් වූ ආදායම් හා වියදම් ඇසුරෙන් 2017 ජනවාරි මාසයට අදාළ ව ලාභය/අලාභය ගණනය කිරීම.

ClassWork.LK

4. ශුද්ධ වත්කම් ඇසුරෙන් 2017 ජනවාරි මාසයේ ලාභය/අලාභය ගණනය කිරීම.

05. ව්‍යාපාරයක ආදායම් ඉපයීමට සහා වියදම් සිදුවීමට ඉවහල් වන පහත ක්ෂේත්‍ර තුනට අදාළ උදාහරණය බැගින් වෙන වෙන ම දක්වන්න.

(1)

- ව්‍යාපාරයක ආදායම් ඉපයීමට අදාළ වන ආර්ථික ප්‍රතිලාභයන්හි ස්වරූපය
  - (1) ව්‍යාපාරය තුළට මුදල් ගලා ඒම ........................
  - (2) ව්‍යාපාරයේ වත්කම් වැඩි වීම ........................
  - (3) වගකීම් අඩුවීම ........................

(2)

- ව්‍යාපාරයක වියදමට අදාළ වන ආර්ථික ප්‍රතිලාභයන්හි ස්වරූපය
  - (1) මුදල් ව්‍යාපාරයෙන් පිටතට ගලා යෑම ........................
  - (2) ව්‍යාපාරයේ වත්කම්වල අගය අඩුවීම ........................
  - (3) වගකීම් වැඩිවීම ........................

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura